# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2267/35 - 2022 පෙබරවාරි මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2022.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XV) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 39 වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 21 වන වගන්තිය සහ 39 වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්. කලින් කල සංශෝධිත පරිදි 2009 මැයි මස 28 වන දින අංක 1603/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන (2021 දෙසැම්බර් මස 8 වන දින අංක 2257/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) "දන්ත වෛද්‍ය පීඨය" යන අයිතමයට සහ උපලේඛනයේ II තීරයේ දැක්වෙන ඊට අනුරූප සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

| "*I වන තීරය* පීඨය | *II වන තීරය* අධ්‍යයන අංශය |
|---|---|
| නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | 1. නාගරික ජෛව සම්පත් අධ්‍යයනාංශය<br>2. ජලජ ජෛව සම්පත් අධ්‍යයනාංශය<br>3. බහුවිධ අධ්‍යයන අධ්‍යයනාංශය ". |

දිනේෂ් ගුණවර්ධන,
අධ්‍යාපන අමාත්‍ය.

2022 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0512


1A - PG 5753 — 611 (2022/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.